## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 2017

-----------------------------------------------

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය සහ 108 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා රාජ්‍ය අංශ විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන
----------------

### 2.1 මතය
--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
--------------------------

විශ්වවිද්‍යාලයේ මහපොල හා ශිෂ්‍යාධාරවලට අදාළ ආදායම සහ වියදම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව පුස්තකාල පොත් සඳහා රු. 8,147,981 ක් හා උපාධි ලෝගු සඳහා රු. 53,128 ක ක්ෂය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) වත්කම්වල ජීව කාලය පිළිබඳ සැලකිල්ලට ගැනීමකින් තොරව වර්ෂයේ ආරම්භක ශේෂය මත ක්ෂය ගණනය කිරීම හේතුවෙන් රු.1,038,296 ක් වැඩිපුර ගිණුම් ගත වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.4,491,474 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම්ගත වී නොතිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්
----------------------------------

අපහරණය කරන ලද දේපල පිරියත උපකරණවලට අදාළ පිරිවැය ගිණුම් සටහන් අනුව ශේෂය රු. 10,083,717 ක් ලෙසද, ඊට අදාළ විස්තරාත්මක ලේඛනවල රු. 10,148,112 ක් ලෙසද දැක්වීම හේතුවෙන් රු. 64,395 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට බැඳුම්කර කඩ කරන ලද කථිකාචාර්යවරුන්ගෙන් ලැබිය යුතු රු. 105,027,745 ක් වූ බැඳුම්කර ශේෂ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බැඳුම්කර කඩ කළ වර්ෂ අනුව සලකා බැලීමේදී සමාලෝචිත වර්ෂයේ අවසානයට අයවිය යුතු රු. 105,027,679 ක් වූ ශේෂයෙන් රු. 36,100,691 ක් එනම් සියයට 34 ක් අවුරුදු 5 ට අඩු බැඳුම්කර ශේෂ වන අතර රු. 66,390,959 ක් හෙවත් සියයට 63 ක් ම

අවුරුදු 10 කට වඩා පැරණි බව නිරීක්ෂණය විය. එකතුව රු. 12,795,674 ක් හෙවත් සියයට 12 ක් වර්ෂ 20 කටත් වඩා පැරණි ශේෂයන් බවත් රු. 2,536,029 ක් එනම් සියයට 02 ක් සම්බන්ධයෙන් අදාළ බැඳුම්කරය කඩ කළ වර්ෂය පවා හඳුනාගෙන නොතිබුණු බවත් වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ii) අයවිය යුතු බැඳුම්කර සම්බන්ධයෙන් ගිණුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සමග අභ්‍යන්තර විගණන අංශය පිළියෙල කරන ලද වයස් විශ්ලේෂණය එකිනෙක සැසඳීමේදී කථිකාචාර්යවරුන් 24 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 12,650,028 ක් අදාළ වයස් විශ්ලේෂණයට ඇතුළත්ව නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iii) පසුගිය වර්ෂයේ අවසානයට පැවති රු. 79,109,414 ක් වූ අයවිය යුතු බැඳුම්කරවල වටිනාකම රු. 360,571 ක් වැඩියෙන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ගණනය කර තිබුණි. කථිකාචාර්යවරුන් 6 දෙනෙකුගෙන් අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු.522,817 කින් අඩුවෙන් දැක්වීමත් තවත් එක් කථිකාචාර්යවරයකුගේ ශේෂය රු. 883,387 කින් වැඩියෙන් දැක්වීමත් නිසා එම වෙනස ඇති වී තිබුණි.

(iv) 2011 වර්ෂයේ බැඳුම්කර කඩකළ කථිකාචාර්යවරයකුගෙන් අයවිය යුතු රු. 478,400 ක්ද, 2016 වර්ෂයේ බැඳුම්කර කඩ කළ කථිකාචාර්යවරුන් 5 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 22,749,902 ක්ද බැඳුම්කර කඩ කළ වර්ෂවල හඳුනානොගෙන සමාලෝචිත වර්ෂයේ හඳුනාගෙන තිබුණි. ඒ අනුව ඒ ඒ වර්ෂවලට අදාළව අයවිය යුතු බැඳුම්කරවල වටිනාකම නිවැරදිව හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය කෙරේ.

(v) කථිකාචාර්යවරයකුගෙන් ලැබිය යුතු බැඳුම්කර වටිනාකම රු. 220,861 ක් බවට උසාවියෙන් තීන්දු කර තිබුණු අතර එය සම්පූර්ණයෙන් අයකර ගෙන අවසන් වුවද තවදුරටත් රු. 167,630 ක් අයවිය යුතු ශේෂයක් දක්වා තිබුණි.

(vi) 2011 වර්ෂය සහ 2015 යන වර්ෂවල බැඳුම්කර කඩ කළ කථිකාචාර්යවරුන් දෙදෙනකු ගෙන් අයවිය යුතු රු. 9,875,229 ක් සමාලෝචිත වර්ෂය වන විටත් ගිණුම් අංශය ඉදිරිපත් කරන ලද උපලේඛනවල හඳුනාගෙන නොතිබුණි.

(vii) බැඳුම්කර වටිනාකම අයකර ගැනීමේදී එය නිවැරදි ලෙස ගණනය නොකිරීම නිසා කථිකාචාර්යවරුන් 07 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 403,578 ක් වැඩිපුර අයකර ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) සේවයෙන් ඉවත්ව ගිය විශ්වවිද්‍යාල සේවකයන් 08 දෙනෙකුට අදාළ රු. 475,667 ක් වූ ණය ශේෂ වසර 5 කට අධික කාලයක් ඉක්ම ගියද අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේද පියවර ගෙන නොතිබුණු අතර සේවකයන් දෙදෙනෙකුගේ ණය ශේෂය වසර 19 කට වඩා පැරණි ඒවා විය. ඉන් සේවකයින් 03 දෙනෙකුගේ සේවක අර්ථසාධක අරමුදල් නිදහස් කර තිබියදී, අරමුදල් නිදහස් කර නොතිබූ බව 2017 ජූලි 13 දිනැති ලිපිය මඟින් මා වෙත වාර්තා කර තිබුණි.

(ඇ) ටෙන්ඩර් තැන්පතු ලෙස 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා විවිධ පුද්ගලයන්ගේ හා අංශවලින් විශ්වවිද්‍යාලය ලබා ගත් රු. 749,490 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 1985 අංක 07 දරන පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 44 (1) (V) වගන්තිය | විශ්වවිද්‍යාලයේ පාලක සභාව සඳහා සාමාජිකයන් 21 දෙනෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කර තිබුණි. එසේ වුවද එම වගන්තිය ප්‍රකාරව පරිපාලන ක්ෂේත්‍රය නියෝජනය කරමින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් නියෝජිතයකු සහ මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක් පත්කිරීමට හැකියාව තිබුණද ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය** | |
| (i) 3.7. සහ 3.8 ඡේද | සේවකයන්ගෙන් ණය වාරික ණය ලබාදුන් මාසයට පසු මාසයේ සිට මාසිකව අයකර ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 29 කදී එසේ නියමිත කාලය තුළ හා අඛණ්ඩව අයකර නොගත් ණය වාරිකවල වටිනාකම රු. 625,860 ක් විය. |
| (ii) 3.18. ඡේදය | ණය මුදල් අයකර ගැනීමට හෝ අයකර ගැනීමේ සතුටුදායක වැඩ පිළිවෙලක් යෙදීමට හෝ කටයුතු නොකර තිබියදී රු. 590,590 ක ආපදා ණය ශේෂයක් සහිත නිලධාරීන් 06 දෙනෙකුට වැටුප් රහිත නිවාඩු ලබා දී තිබුණි. |
| **(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 454 (1) | ආණ්ඩුවේ දේපලවල සහ ගබඩා බඩුවල සෑම ද්‍රව්‍යක්ම බාර ගැනීම හා නිකුත් කිරීම බඩු ලේඛන පොතෙහි සඳහන් කළ යුතු වුවත් විශ්වවිද්‍යාලය සතු විදුලි උත්පාදක යන්ත්‍ර 6 ක් බඩු ලේඛන පොතෙහි ඇතුළත් කර නොතිබුණි. |
| (ඈ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 (2)(ආ) | තත්කාර්ය අත්තිකාරම් උපරිම සීමාව වන රු. 100,000 ඉක්මවා අවස්ථා 25 කදී රු. 3,448,097 ක අත්තිකාරම් ලබාදී තිබුණි. |

| | |
|---|---|
| **(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහය** | |
| (i) XXVI පරිච්ඡේදයේ 2.1 ඡේදය | මුදල් වර්ෂය අවසාන දිනට ආයතනයට අයත් සියලුම භාණ්ඩ සහ ස්ථාවර වත්කම්, අදාළ කාර්යය සඳහා පත් කරනු ලබන සමීක්ෂණ මණ්ඩලයක් විසින් හරි වැරදි බැලිය යුතු වුවත්, 2015 වර්ෂයෙන් පසුව විශ්වවිද්‍යාලයේ පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ii) 20 වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 10 වෙනි පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඊ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන්, චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| **(උ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006** | |
| (i) 1.4.3 වගන්තිය | විදුලි උත්පාදක යන්ත්‍ර මිලදී ගැනීමේදී වැඩ ඉංජිනේරුවරයා සම්බන්ධතා පිළිබඳ අනනුකූලතාවයකින් කටයුතු කර නොතිබුණි. |
| (ii) 2.8.1 (ආ) හා 7.3.1 (ආ) වගන්ති | සමාලෝචිත වර්ෂයේ විදුලි උත්පාදක යන්ත්‍ර ප්‍රසම්පාදනය සඳහා පත්කළ තාක්ෂණ ඇගයීම් කමිටුවට විෂය විශේෂඥයකු වශයෙන් විදුලි ඉංජිනේරුවරයකු පත්කිරීමට කටයුතු කිරීමකින් තොරව කොන්ත්‍රාත් කාර්යයේ උපදේශක වශයෙන්ද කටයුතු කරන විශ්වවිද්‍යාලයේ වැඩ ඉංජිනේරුවරයා ඒ සඳහා පත් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 224,091,778 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 156,499,651 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 67,592,127 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂයේ රජයේ පුනරාවර්තන ප්‍රදාන ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 370,048,000 කින් වැඩිවී තිබුණද, වැටුප් හා දීමනා රු. 297,649,467 කින්, ගිවිසුම්ගත සේවා වියදම් රු. 145,858,803 කින්, ස්ථාවර වත්කම් පුනරාවර්තන වියදම් හා පර්යේෂණ වියදම් රු. 86,880,237 කින් සහ අනෙකුත් වියදම් රු. 70,832,816 කින් වැඩිවීමත් ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2013 වර්ෂයේ රු. 341,172 ක් වූ ඌනතාවය 2014 වර්ෂය වන විට රු. 145,069,392 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණද 2015 වර්ෂයෙදී නැවත රු. 17,883,619 ක ඌනතාවයක් දක්වා පිරිහී තිබුණි. 2015 වර්ෂයේ ආරම්භ වූ පිරිහීම අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය වන විට එම පිරිහීම රු. 224,091,778 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු. 1,508,188,994 ක ධන අගයක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂය වන විට රු. 2,727,244,746 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වියදමද ඇතුළුව සේවක පාරිශ්‍රමික රු. මිලියන 2,475.08 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 13.45 කින් වැඩි වී තිබුණි. රු. මිලියන 3,162.16 ක් වූ සමස්ත රජයේ පුනරාවර්තන ප්‍රතිපාදනවලින් රු. මිලියන 2,475.08 ක් එනම් සියයට 78.27 ක් සේවක පාරිශ්‍රමික සඳහා වැය කර තිබුණු අතර විශ්වවිද්‍යාලයේ අනෙකුත් සියලුම වියදම් සඳහා රු. මිලියන 687.07 ක් හෙවත් සමස්ත රජයේ පුනරාවර්තන ප්‍රතිපාදනවලින් සියයට 21.73 ක් පමණක් යෙදවී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට 2016 ක් වූ විශ්වවිද්‍යාලයේ සමස්ත කාර්ය මණ්ඩලයේ ඒ ඒ තනතුරුවලට අදාළ පාරිශ්‍රමිකවල වෙනස්කම් නොසලකා ගණනය කිරීමේදී වාර්ෂික ඒක සේවක පිරිවැය රු. 1,227,718 ක් බව නිරීක්ෂණය විය.

## 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ඔහු එම තනතුරෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට එරෙහිව දිසා අධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

(ආ) කළමණාකරන පශ්චාත් උපාධි ආයතනයේ සේවය කළ නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයකුගේ දෙවන වර සේවා දිගුව විශ්වවිද්‍යාලය විසින් ලබා නොදීම සම්බන්ධයෙන් ඔහු විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව මහාධිකරණයේ නඩු පවරා තිබුණි.

(ඇ) විධිමත් විනය පරීක්ෂණයකින් සේවය අවසන් කළ ලිපිකරු III ශ්‍රේණියේ නිලධාරියකු නැවත සේවයේ පිහිටුවීමට කම්කරු විනිශ්චය සභාව ලබා දුන් නඩු තීන්දුවට එරෙහිව විශ්වවිද්‍යාලය විසින් මහාධිකරණයේ අභියාචනයක් ගොනු කර තිබුණි.

(ඈ) බැඳුම්කර කඩ කිරීම හේතුවෙන් අයවිය යුතු රු. 5,103,826 ක් අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් හිටපු කථිකාචාර්යවරයකුට එරෙහිව අභියාචනාධිකරණයේ නඩු පවරා තිබුණි.

(ඉ) බැඳුම්කර කඩ කිරීම හේතුවෙන් අයවිය යුතු රු. 10,762,632 ක් අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් ආධුනික කථිකාචාර්යවරයකුට එරෙහිව දිසා අධිකරණයේ නඩු පවරා තිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි දෙකක් අලුත්වැඩියා කිරීමේ කටයුතු අතහැර ගොස් තිබුණු කොන්ත්‍රාත්කරුවකුගෙන් රු. 1,785,240 ක් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය දිසා අධිකරණයේ නඩු දෙකක් ගොනු කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්යසාධනය

-------------------

#### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

---------------------------------------

(අ) විශ්වවිද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාලයේ අලුතින් ආරම්භ කළ ඉංජිනේරු හා තාක්ෂණ පීඨය හැර අනෙකුත් පීඨ 4 හි සමාලෝචිත වර්ෂයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වූ 12,054 ක් වෙනුවෙන් දරා තිබූ පුනරාවර්තන වියදම රු. 3,127,368,214 ක් වූ අතර ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 11,609 දෙනෙකු වෙනුවෙන් රු. 2,913,911,823 ක් දරා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය ඒක ශිෂ්‍ය පිරිවැය රු. 259,447 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව එය රු. 8,442 කින් හෙවත් සියයට 3 කින් වර්ධනය වී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව එම පීඨ 4 හි මුළු පුනරාවර්තන වියදම රු. 213,456,391 කින් හෙවත් සියයට 7 කින් වැඩි වී තිබුණද, ඒක ශිෂ්‍ය පිරිවැයේ වැඩිවීම සියයට 3 ක් වීමට සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍ය සංඛ්‍යාව ඉකුත් වර්ෂයට වඩා 445 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ii) අලුතින් ආරම්භ කරන ලද තාක්ෂණ පීඨයේ සිසුන් 642 ක් හා ඉංජිනේරු පීඨයේ සිසුන් 240 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරන ලද පුනරාවර්තන වියදම පිළිවෙලින් රු. 164,843,281 ක් හා රු. 118,019,455 ක් බැවින් සමාලෝචිත වර්ෂයේ තාක්ෂණ පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු. 256,765 ක්ද, ඉංජිනේරු පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු. 491,748 ක්ද වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ පීඨ 6 කට අභ්‍යන්තර සිසුන් 3,497 ක් බඳවා ගෙන තිබුණු අතර භෞතික විද්‍යා විෂයධාරාව සඳහා සිසුන් 28 දෙනෙකුද, ආහාර තාක්ෂණ විෂය ධාරාව සඳහා සිසුන් දෙදෙනෙකුද, කළමනාකරණ විෂය ධාරාව සඳහා සිසුන් 04 දෙනෙකුද, වාණිජවේදී විෂය ධාරාව සඳහා සිසුන් දෙදෙනෙකුද, රාජ්‍ය කළමනාකරණය විෂය ධාරාව සඳහා සිසුන් දෙදෙනෙකුද, හෙද විෂය ධාරාව සඳහා සිසුන් 06 දෙනෙකුද, ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාව සඳහා එක් සිසුවකුද බඳවා ගෙන නොතිබුණි.

(ඇ) අංක 15/2015 හා 2015 නොවැම්බර් 17 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛය ප්‍රකාරව උසස් අධ්‍යාපන ආයතන මඟින් පවත්වනු ලබන අභ්‍යන්තර ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි පරීක්ෂණවල ප්‍රතිඵල අදාළ විභාගය පවත්වන ලද දින සිට මාස තුනක කාලයක් ඇතුළත නිකුත් කළ යුතු වන අතර විගණන පරීක්ෂාව සිදු කරන ලද පීඨ 06 න් 04 ක ප්‍රතිඵල නිකුත් කිරීම් පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨයේ 2017 පළමු අර්ධ වර්ෂයේ අවසන් පරීක්ෂණයෙහි ප්‍රතිඵල දින 16 සිට දින 28 දක්වා කාලයක් ප්‍රමාද වී නිකුත් කර තිබුණි.

(ii) මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ 2017 පළමු අර්ධ වර්ෂයේ අවසන් පරීක්ෂණය 2017 අගෝස්තු 19 දින අවසන් වී තිබුණු අතර එම ප්‍රතිඵල නිකුත් කිරීම දින 54 සිට දින 102 ක් දක්වා ප්‍රමාද වී තිබුණි. තවද 2017 දෙවන අර්ධ වර්ෂයේ අවසන් පරීක්ෂණය 2018 පෙබරවාරි 17 දින අවසන් වී තිබුණද එහි ප්‍රතිඵල නිකුත් කිරීම දින 27 සිට දින 42 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.

(iii) ඉංජිනේරු පීඨයේ 2017 පළමු අර්ධ වර්ෂයේ අවසන් පරීක්ෂණය 2017 මැයි 21 අවසන් වී තිබූ අතර 2017 සැප්තැම්බර් 28 දින ප්‍රතිඵල නිකුත් කර තිබුණි. ඒ අනුව පළමු වසර ශිෂ්‍යයින් පමණක් විභාගවලට පෙනී සිටි එම පීඨයෙහි ප්‍රතිඵල නිකුත් කිරීම දින 40 ක් ප්‍රමාද වී තිබුණි.

(iv) ව්‍යවහාරික විද්‍යා පීඨයේ තෙවන හා සිව්වන වසරවල විභාග ප්‍රතිඵල නිකුත් කිරීම බොහෝ සෙයින් ප්‍රමාද වී තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව 2017 දෙවන අර්ධ වර්ෂයේ තෙවන හා සිව්වන වසරවල අවසන් පරීක්ෂණ 2017 ඔක්තෝබර් 28 දින පවත්වා තිබුණු අතර ප්‍රතිඵල නිකුත් කිරීම දින 116 ක් ප්‍රමාද වී තිබුණි. තවද ව්‍යවහාරික විද්‍යා පීඨයේ පළමු හා දෙවන වසර සිසුන්ගේ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධ තොරතුරු පද්ධතියක් නොපැවතීම හේතුවෙන් විභාග ප්‍රතිඵල නිකුත් කළ දිනයන් විගණනයේදී අනාවරණය නොවූ අතර පළමු හා දෙවන වසර සිසුන්ගේ විභාග ප්‍රතිඵල අදාළ කථිකාචාර්යවරුන් විසින් පීඨ මණ්ඩලයේ අනුමැතියකින් තොරව සෘජුවම ඉගෙනුම් කළමනාකරණ පද්ධතියට අත්පතනය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහයේ 20 වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ X වෙනි පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය ප්‍රකාරව අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට 2010 සැප්තැම්බර් 07 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් දී තිබුණි. එහෙත් මෙතෙක් එවැන්නක් සකස් කර නොතිබුණු බැවින්, අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු. 1,931,193,768 ක් වූ වැටුප් හා දීමනාවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකිවිය. අනෙකුත් රජයේ ආයතන විසින් ක්‍රියාත්මක කරන රාජකාරී සඳහා පැමිණීමේ සහ පිටවීමේ වේලාව සටහන් කිරීමේ ක්‍රම කිසිවක් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවන අතර, කථිකාචාර්යවරුන් නිසිපරිදි දේශන සඳහා සහභාගී වන බැවින් එවැනි අවශ්‍යතාවයක් නොමැති බව විගණන විමසුම්වලට පිළිතුරු වශයෙන් දක්වා තිබුණි. එසේ වුවද, කථිකාචාර්යවරුන් දේශන සඳහා පැමිණීම පිළිබඳව අධ්‍යයන අංශ කිහිපයක සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු අනුව ඒ සම්බන්ධයෙන් සතුටුදායක පාලන ක්‍රමයක් නොපවතින බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය විය.

(i) සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ, 2017 වර්ෂයේ පළමු සමාසිකයට අදාළ කාර්යසාධනය පරීක්ෂා කිරීමේදී අධ්‍යයනාංශය විසින් ඉදිරිපත් කරන ලද කාලසටහන අනුව කළ යුතු දේශන පැය ගණනට වඩා අඩු ප්‍රමාණයක් සිදු කර තිබුණු බව ශිෂ්‍ය අත්සන් ලේඛන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මේ අනුව විෂයයන් 19 කට අදාළව කාල සටහන්වල වෙන් කර තිබුණු දේශන පැය ප්‍රමාණයට වඩා පැය 164 ක් අඩුවෙන් දේශන පවත්වා තිබුණු බවත් දේශන ප්‍රතිමාණ සැලැස්ම අනුව එක් එක් කථිකාචාර්යවරයා පැවැත්විය යුතු අවම දේශන පැය ප්‍රමාණය පවත්වා නොතිබුණු අවස්ථා 11 ක් පැවති බවත් නිරීක්ෂණය විය.

(ii) නිබන්ධන ඉදිරිපත් කිරීම්, ක්ෂේත්‍ර අධ්‍යයන වැනි සෘජු ලෙස සිසුන් සම්බන්ධ කෙරෙන අධ්‍යයන කාර්යයන්වලට අදාළ පැමිණීමේ ලේඛන පවත්වා ගත යුතු බව අධ්‍යයනාංශ ප්‍රධානීන් තීරණය කර තිබුණද එවැනි පැමිණීමේ ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි.

(iii) අධ්‍යයනාංශයේ නියුතු ස්ථිර කථිකාචාර්යවරු 14 දෙනෙකු සහ බාහිර කථිකාචාර්යවරු 05 දෙනෙකු දේශන සඳහා යොදා ගෙන තිබුණු අතර එම කථිකාචාර්යවරු විසින් සමාසිකයට අදාළව එක් එක් විෂයයන් වෙනුවෙන් පැය 15 බැගින් විෂයයන් 37 සඳහා නිබන්ධන පංති පැය 555 ක් පැවැත්විය යුතු වුවද එය සිදු කළ බවට සාක්ෂි කිසිවක් නොතිබුණි.

(iv) පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ 2014/2015 අධ්‍යයන වර්ෂයේ පළමු අර්ධ වර්ෂයට අදාළ කාර්යසාධනය පරීක්ෂා කිරීමේදී දේශන කාල සටහන් අනුව පැවැත්විය යුතු දේශන පැය සංඛ්‍යාවට වඩා අඩුවෙන් දේශන පවත්වා තිබූ බව නිරීක්ෂණය වූ අතර එහිදී විෂයයන් 51 ක් සම්බන්ධයෙන් මෙසේ අඩුවී ඇති දේශන පැය සංඛ්‍යාව 202 ක් බව නිරීක්ෂණය විය.

(v) සිසුන්ගේ අත්සන් පත්‍රිකා පරීක්ෂාවේදී එම පත්‍රිකාවල දේශකවරයාගේ හෝ අධීක්ෂකයකුගේ අත්සන, නම, දිනය හා වේලාව සටහන් නොකිරීමෙන් ඒ ඒ අවස්ථාවල අදාළ දේශනය කෙතරම් කාලයක් සිදුකර තිබේද හෝ දේශන පැවැත්වූ බවට තහවුරුවක් ලබා ගැනීමට සාක්ෂි වශයෙන් භාවිතා කළ නොහැකිව පැවතුණි.

(ඉ) විශ්වවිද්‍යාලයක් විසින් සිදුකරන පර්යේෂණවලින් එම විශ්වවිද්‍යාලයේ තත්ත්වය ඉහළ නැංවෙන අතර ජාතික ආර්ථිකයටද විශාල දායකත්වයක් සපයනු ලැබේ. එබැවින් විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ට පර්යේෂණාධාර ලබාදීම සඳහා රජය විසින් විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වාර්ෂිකව වෙන් කරන අතර සමාලෝචිත වර්ෂයේ කථිකාචාර්යවරු 84 දෙනෙකුට පර්යේෂණ ප්‍රදාන වශයෙන් රු. මිලියන 164.85 ක් වෙන්කරදී තිබුණි. තවද 2012 වර්ෂයේ සිට ඉකුත් වර්ෂය අවසානය වන විට කථිකාචාර්යවරු 227 දෙනෙකු සඳහා රු. මිලියන 255.61 ක් වෙන්කර දී තිබුණි. එසේ වුවද 2012 වර්ෂයේ 24 දෙනෙකු, 2013 වර්ෂයේ 15 දෙනෙකු, 2014 වර්ෂයේ 08 දෙනෙකු, 2015 වර්ෂයේ 37 දෙනෙකු සහ 2016 වර්ෂයේ 54 දෙනෙකු වශයෙන් කථිකාචාර්යවරු 138 ක් අදාළ පර්යේෂණ අතහැර දමා තිබුණු අතර විශ්වවිද්‍යාලය එම කථිකාචාර්යවරුන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැටුප් සහ දීමනා වැරදි ලෙස ගණනය කිරීම, පරිගණක මුරපද භාවිතයේ අක්‍රමිකතා පැවතීම, බදු සහ ණය වාරික අවකරණ දෝෂ සහගත වීම, ද්විගණන දෝෂ පැවතීම, ආදාන ප්‍රතිදාන පිළිබඳ ප්‍රමාණවත් අභ්‍යන්තර පරීක්ෂාවක් නොමැති වීම, විවිධ ස්ථානවලින් ක්‍රියාකාරීත්වයට බලපෑම් සිදුකළ හැකි වීම නිසා දත්ත ආදාන කටයුතු සම්පූර්ණ ආරක්ෂිතව සිදු නොවන බවට කරුණු අනාවරණය වීම සහ විශ්වවිද්‍යාලයේ පරිගණක අංශය විසින් සකස් කරන ලද සමාන ධාරිතාවයක් ඇති ආයතනවල භාවිතා නොකරන අර්ධ ස්වයංක්‍රීය මෘදුකාංගයක් වීම යනාදී අඩුපාඩු 11 ක් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ වැටුප් සැකසීම සඳහා භාවිතා කරන පරිගණක මෘදුකාංගය කෙරෙහි විශ්වාසය තැබිය නොහැකි බව ඉකුත් වර්ෂයේ විගණනයේදී පෙන්වා දෙන ලදී. ඒ අනුව ස්වාධීන පාර්ශවයක් ලවා පද්ධති විගණනයක් සිදුකර මාස 06 ක් ඇතුළත මෘදුකාංගයේ අඩුපාඩු නිවැරදි කිරීමටත්, නව පරිගණක පද්ධතියක් හඳුන්වාදීමටත් කටයුතු කළ යුතු බවට සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 10 දින රැස්වූ 466 වැනි පාලක සභාව තීරණය කර තිබුණි. එසේ වුවද 2018 අගෝස්තු 31 දින දක්වාම අදාළ ක්‍රියාවලිය නිමකර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල, වෛද්‍ය පීඨය, සුමංගල ගොඩනැගිල්ල සහ විමලා ද සිල්වා නේවාසිකාගාරය යන ස්ථානවල ස්ථාපිත කර තිබුණු පැරණි එහෙත් භාවිතයට ගන්නා ජෙනරේටර් 4 කට අදාළව වූ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) වන හා පාරිසරික විද්‍යා අධ්‍යයනාංශයට අනුබද්ධිත තිරසාරත්වය පිළිබඳ කේන්ද්‍රය පිහිටුවීමට අදාළ ව්‍යවස්ථාව ප්‍රකාරව එහි අරමුදලින් සියයට 25 ක් කාර්ය මණ්ඩලයේ පඩිනඩි සඳහා යොදා ගත හැකි බව දක්වා තිබුණද, වැඩසටහන් කළමණාකරු, ලේකම්, ව්‍යාපෘති සහකාර යන තනතුරු 03 සඳහා විශ්වවිද්‍යාලයේ තාවකාලික ප්‍රදර්ශකවරුන් 3 දෙනෙකු පූර්ණ කාලීනව යොදා ගෙන තිබුණු අතර ඔවුන්ගේ වැටුප් හා දීමනා අදාළ ව්‍යාපෘතියේ ආදායමෙන් නොගෙවා විශ්වවිද්‍යාලයේ අරමුදල්වලින් ගෙවා තිබුණු අතර 2016 වර්ෂයේ සිට 2018 වර්ෂයේ සැප්තැම්බර් 10 දින වන විට රු.මිලියන 5 කට ආසන්න මුදලක් විශ්වවිද්‍යාල අරමුදලින් ඒ සඳහා වැයකර තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

ජෙනරේටර්වලට යෙදීම සඳහා ඩීසල් ලීටර් 11,260 ක් මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය පාලන අංශය විසින් ඉන්ධන ඇණවුම් නිකුත් කර තිබුණද ඉන් ලීටර් 6,060 කට අදාළ ඉන්ධන ඇණවුම් 8 ක් නඩත්තු අංශයේ තොග පොතෙහි සටහන් කර නොතිබුණි. එසේ වුවද වැඩ අධිකාරීගේ කළ වැඩ වාර්තා අනුව ඉන්ධන ලීටර් 9,970 ක් ජෙනරේටර්වලට යොදු බව සටහන් කර තිබුණි. තවද තෙල් තොග විශ්වවිද්‍යාලයට රැගෙන ඒම, ඒවා ජෙනරේටර්වලට යෙදීම සහ ඉතිරි තොගය පවත්වාගෙන යාම වැඩ අධිකාරි විසින්ම සිදු කර තිබුණු බවත්, ගබඩා භාරකරු වැඩ අධිකාරී විසින් ලබා දෙන තොරතුරු පොත්වල සටහන් කිරීම පමණක් සිදු කරන බවත්, සහකාර ලේඛකාධිකාරී සාමාන්‍ය පාලන විසින් වැඩ අධිකාරීගේ ඉල්ලීම මත ඉන්ධන ඇණවුම් නිකුත් කිරීම සහ බිල්පත් ලබා ගැනීම පමණක් සිදු කරන බවත් අනාවරණය වූයෙන් ජෙනරේටර්වලට ඉන්ධන සැපයීමේ අභ්‍යන්තර පාලන ක්‍රමය ඉතා දුර්වල තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

**4.4 අරමුදල් ඌන උපයෝජනය**

අපේක්ෂිත වියදම් පිළිබඳව නිශ්චිත තක්සේරු කිරීමකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් ගොඩනැගිලි හා ව්‍යුහ සඳහා ලැබී තිබුණු රු. 2,628,076 ක්ද, සෞන්දර්ය කුසලතා වැඩිදියුණු කිරීම සඳහා ලැබී තිබුණු රු. 1,570,849 ක්ද, ශාරීරික අධ්‍යාපන ඒකකය වැඩිදියුණු කිරීම සඳහා ලැබී තිබුණු රු. 1,249,500 ක්ද, 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කිරීමකින් තොරව ඉතිරිව පැවතුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 2,307 ක් වූ අතර එයින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 205 ක්ද, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ තනතුරු 34 ක්ද, පරිපාලන කාර්ය මණ්ඩලයේ තනතුරු 02 ක්ද, අනෙකුත් විධායක කාර්ය මණ්ඩලයේ තනතුරු 09 ක්ද හා වෛද්‍ය තනතුරු 03 ක්ද පුරප්පාඩුව පැවතුණි.

(ආ) අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලය 1,066 ක් විය. ඉන් 916 ක් ස්ථිර පදනමින් ද, 15 දෙනෙකු කොන්ත්‍රාත් පදනමින්ද බඳවා ගෙන තිබුණු අතර තනතුරු 135 ක් පුරප්පාඩුව පැවතුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද ආයතනය විසින් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ තිරසාර සංවර්ධන වැඩසටහන් පිළිබඳව 2018 මාර්තු 21 දිනැතිව මා විසින් විශ්වවිද්‍යාලය වෙතින් ඉල්ලා යවන ලද ආකෘති පත්‍රය ප්‍රකාර තොරතුරු 2018 ඔක්තෝබර් 15 දින දක්වාම විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---

#### 6.1.1 ප්‍රසම්පාදනයන්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016/2017 වර්ෂයේ ආපනශාලා පවත්වාගෙන යාම සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ 2016 අගෝස්තු 28 දින ලංසු කැඳවීම සිදුකර තිබුණි. එහිදි ආපනශාලා 14 ක් සඳහා ලංසු 38 ක් ලැබී තිබුණු අතර ශ්‍රී සෝරත නේවාසිකාගාර ආපනශාලාව සඳහා එක් ලංසුවක් ඉදිරිපත් කර තිබුණි. පසුව එම ලංසුකරු ද කොන්ත්‍රාත්තුව භාරගැනීම ප්‍රතික්ෂේප කිරිම හේතුවෙන් නැවත 2016 ඔක්තෝබර් 11 දින අනෙක් ආපනශාලාවලට ලංසු ඉදිරිපත් කරන ලද ලංසුකරුවන් 38 දෙනාගෙන් 5 දෙනෙකු පමණක් තෝරා ගෙන ශ්‍රී සෝරත ආපන ශාලාව සඳහා නැවත ලංසු කැඳවා තිබුණි. එසේ වුවද එම ලංසුකරුවන් 5 දෙනා පිළිගත හැකි පදනමකින් තොරව තෝරා ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.45,961,020 ක් වැයකර 500KVA විදුලි උත්පාදක යන්ත්‍ර 3 ක් සපයා සවි කිරීමේ ප්‍රසම්පාදන කාර්යයට අදාල ලේඛන පරීක්ෂාවේදී වූ නිරීක්ෂණ පහතින් දැක්වේ.

(i) ජාතික තරඟකාරි ලංසු ක්‍රමය අනුගමනය කරමින් 2016 සැප්තැම්බර් 24 දින එක් ජාතික පුවත්පතක පමණක් දැන්වීම් පළකරමින් ජයග්‍රාහී ලංසුකරු ලෙස දේශීය නියෝජිතායතනයක් තෝරාගෙන තිබුණි.

(ii) සැපයුම්කරු සමග වැට් රහිත වටිනාකම රු. 45,961,020 කට මෙම විදුලි ජනක යන්ත්‍ර 03 මිලදී ගැනීම සඳහා ගිවිසුම් ගත වූ දින සිට දින 120 ක් ඇතුළත සපයා සවිකිරීමේ කොන්දේසිය මත 2016 දෙසැම්බර් 30 දින ගිවිසුම් ගත වී තිබුණි. පසුව සැපයුම්කරුගේ 2017 අප්‍රේල් 27 දිනැති ඉල්ලීම මත 2017 ජූලි 31 දින දක්වා දින දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද සැපයුම්කරු මෙම යන්ත්‍ර සවිකිරීම 2018 අප්‍රේල් 26 දින දක්වාම ප්‍රමාද කර තිබුණි.

(iii)ප්‍රසම්පාදනයට අදාළ තාක්ෂණික පිරිවිතර පිළියෙළ කිරිම, සේවා කොන්දේසි නිර්ණය කිරීම, වැඩ විෂය පථය තීරණය කිරීම යනාදිය වැඩ ඉංජිනේරුවරයා විසින්ම සිදුකර තිබුණු අතර විදුලි උත්පාදක යන්ත්‍ර දේශීය නියෝජිතයාගෙන් මිලදී ගැනීමට තීරණය කර තිබුණද සැපයුම්කරු විසින් සපයනු ලබන ජෙනරේටර්වලට අදාළ නිෂ්පාදකයාගේ කර්මාන්ත ශාලාවේදී යන්ත්‍රයේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීමට ඉංජිනේරුවරයා සහ තවත් නිලධාරියෙකු සහභාගී කර ගත යුතු වන බවත් ඒ සඳහා යන වියදම් සැපයුම්කරු විසින් දැරිය යුතුවන බවත් තාක්ෂණික පිරිවිතර හා අනුකූලතා ලේඛන යටතේ වැඩ විෂය පථය යටතට ඇතුළත් කර තිබුණි. මෙම කොන්දේසිය හේතුවෙන් සැපයුම්කරුවන් ඉදිරිපත් කරන මිල ගණන් ඉහළ යාමක් සිදුව තිබිය හැකි බව නිරීක්ෂණය කළ හැකි අතර මෙම නියෝජිතායතනය ශ්‍රී ලංකාව පුරා විවිධ ආයතනවලට විශාල වශයෙන් මෙවැනි ජෙනරේටර් සපයා ඇති බැවින් එවැනි යන්ත්‍රයක් හෝ කිහිපයක් විදුලි ඉංජිනේරුවකු ලවා පරීක්ෂා කර ගැනීමේ හැකියාව තිබියදී අදාළ පරීක්ෂාව සඳහා වැඩ ඉංජිනේරුවරයා සහ

තවත් නිලධාරියෙකු දින 6 ක ඉතාලි සංචාරයකට සහභාගී වී තිබුණු අතර මෙම නිලධාරීන් දෙදෙනාගේ යැපීම් දීමනා සහ උණුසුම් ඇඳුම් දීමනාව සඳහා විශ්වවිද්‍යාලය විසින් රු. 102,185 ක වියදමක් දරා තිබුණි.

(ඇ) වැට් රහිත මිල රු. 2,810,000 ක් වටිනා 50 KVA විදුලි උත්පාදක යන්ත්‍රය මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම මිලදී ගැනීම සඳහා 2017 අප්‍රේල් 26 දින ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණු අතර විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට ලිපි මඟින් දැනුම් දී වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ සැපයුම්කරු තෝරාගෙන තිබුණි.

(ii) තාක්ෂණික පිරිවිතර අනුව විදුලි උත්පාදක යන්ත්‍රයේ එන්ජිම සඳහා වායු විමෝචන සහතිකයක් ඉල්ලා තිබුණු අතර කොන්ත්‍රාත් ආයතනය වායු විමෝචන සහතිකයක් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) තාක්ෂණික ඇගයීම් කමිටු හා ලංසු විවෘත කිරීමේ කමිටු පත්වීම් සඳහා විධිමත් පත්වීමේ ලිපි නිකුත් කර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ කාන්තා නේවාසිකාගාර 20 ක් හා පිරිමි නේවාසිකාගාර 18 ක් සඳහා නේවාසිකාගාර භාරකරුවන් 54 කගේ සේවය ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසුව 2017 ජූලි මස සිට අවම මිල ඉදිරිපත් කළ සමාගමට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණද එම සමාගම නිසි පරිදි අදාල නේවාසිකාගාරවලට සේවකයන් නොයෙදීම හේතුවෙන් 2017 නොවැම්බර් සිට සේවය අත්හිටුවා තිබුණි. ඒ පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2016 අංක 03 දරන සේවකයන්ගේ ජාතික අවම වේතන පනත, 2016 අංක 04 දරන සහ 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත අනුව යම් කර්මාන්තයක හෝ සේවාවක නියුක්ත සියළුම සේවකයන් සඳහා අවම මාසික වේතනය රු. 13,500 ක් විය යුතු අතර සේවකයන්ගේ අවම දෛනික වේතනය රු. 540 ක් විය යුතු නමුත් ඒ පිළිබඳ සැලකිල්ලක් නොදක්වා දෛනික වේතනය රු. 472 ක් ලෙස මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ii) එක් එක් සේවකයාගේ වැටුප පදනම් කර ගනිමින් පිරිවැය ඇස්තමේන්තුව සකස් කිරීමෙන් පසුව අවම මිල තීරණය කර එම අවම මිල ප්‍රසම්පාදන දැන්වීමේ පළකිරිම වෙනුවට එක් එක් සේවකයාගේ වැටුප පදනම් කර ගනිමින් මිල ගණන් කැඳවීම හේතුවෙන් ලංසු ඉදිරිපත් කළ ආයතන අඩුම සේවක වැටුප් ඉදිරිපත් කිරීමට පෙලඹවීමත් ඇති වී තිබුණි. සේවක අර්ථසාධක හා සේවක භාරකාරක අරමුදල් සඳහා දායක මුදල් ගෙවන බවට හා රාජ්‍ය ප්‍රතිපත්ති අනුව අවම සේවක වැටුප් ගෙවීම් සම්බන්ධ කොන්දේසි ඇතුළත් නොකිරීම හේතුවෙන් කම්කරු නීතිරීති සහ සේවක දුක්ගැනවිලි සම්බන්ධයෙන් අනවශ්‍ය වගකීමක් දැරීමට විශ්වවිද්‍යාලයට සිදුවී තිබුණි.

(iii) ඉකුත් වර්ෂයේ මෙම සේවාව ලබාදුන් ආයතනයේ ගිවිසුම්ගත කාලය 2016 දෙසැම්බර් 15 දිනෙන් අවසන් වූ බැවින් 2016 ඔක්තෝබර් 12 තාක්ෂණික ඇගයීම් කමිටු පත්කරමින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබුණද නව ආයතනයක් තෝරා ගැනීමට 2017 ජූලි 16 දින දක්වා ප්‍රමාද වී තිබුණි. නිසි පරිදි ප්‍රසම්පාදනය සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීමේ කළමනාකරණ දුර්වලතා හේතුවෙන් මාස 9 ක කාලයක් පුරා ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබූ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කළ කාලය තුළ ඒ දක්වා විශ්වවිද්‍යාලයට මෙම සේවාව සැපයූ ආයතනය තවදුරටත් සේවයේ තබා ගනිමින් කොන්ත්‍රාත් ගිවිසුමෙන් බැහැරව 2017 ජූලි 15 දක්වා රු. 10,232,973 ක් ගෙවා තිබුණි.

(iv) ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි ඉටුනොකිරීම හේතුවෙන් හා 2017 වර්ෂය සඳහා නේවාසිකාගාර භාරකාර සේවා සඳහා තෝරා ගත් ආයතනයේ ගිවිසුම 2017 නොවැම්බර් 12 දින සිට අතරමඟ නතර කර දැමීම හේතු කර ගෙන 2017 දෙසැම්බර් සිට විශ්වවිද්‍යාලය අදාළ සේවය, කලින් සිටි සේවකයන් උපයෝගී කර ගනිමින් පවත්වා ගෙන ගොස් තිබුණු අතර මේ වෙනුවෙන් විශ්වවිද්‍යාලය 2017 වර්ෂයේ රු. 2,073,150 ක් ද 2018 මැයි මස දක්වා රු. 4,116,812 ක් ද ගෙවීම් කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 6.2 අයවැය පාලනය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 102 වගන්තියට පටහැනිව මූල්‍ය වගකීම් ඇතිවීමෙන් පසුව එම වටිනාකම්වලට සමානුපාතිකව අයවැය ඇස්තමේන්තුව පිළියෙල කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 8 කදී වරින්වර අයවැය ලේඛනය සංශෝධනය කර තිබුණි.

## 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 5 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1994 ජුනි 29 දින ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1998 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක්ද, සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 50 ක්ද වශයෙන් රු. මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද, අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු 2017 අගෝස්තු 31 දක්වාම සිදුකර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයෙහි රු. මිලියන 61.5 ක් වැය කර මිලදී ගෙන තිබුණු කොහුවල ඉඩම හා ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයට නොගැලපෙන හෙයින් කැළණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය වෙත පවරා දී තිබූ නමුත් මෙම පැවරීම ගිණුම්ගත කර නොතිබුණු අතර, විශ්වවිද්‍යාලය භාවිතා නොකරන වත්කමක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්ව තිබුණි.

(ඇ) පිරිවැය රු. මිලියන 70 ක් වූ විශ්වවිද්‍යාලයේ අපජලය බැහැර කිරීමේ ව්‍යාපෘතියක් සඳහා 2003 අගෝස්තු 6 වැනි දින ලැබී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත එහි ඉදිකිරීම් සැලසුම් කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය වෙත රු. 2,336,090 ක් ගෙවා තිබුණි. ඉදිකිරීම් ආරම්භ නොකිරීම සම්බන්ධයෙන් 2011 වර්ෂයේ විගණකාධිපති වාර්තාවට පිළිතුරු වශයෙන් අදාළ ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය කර ඇති දක්වා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලද කෙරීගෙන යන වැඩ යටතේ එම ශේෂය දක්වා තිබුණි.

(ඈ) 1990 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරමක් ලෙස ඉදිරියට ගෙන එන ලද රු. 1,310,000 ක් මහරගම නගර සභාව වෙත ගෙවා ඇති බව සඳහන් කර තිබුණු නමුත් එම අත්තිකාරම නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේ ද කටයුතු කර නොතිබුණි.

(ඉ) රජයේ හෝ රජයේ අනුබද්ධිත ආයතනවල සේවය සඳහා වැටුප් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත 2009 වර්ෂයේදී ආරක්ෂක අමාත්‍යාංශයට මුදාහැර තිබුණු කථිකාචාර්යවරියකට ගෙවන ලද වැටුප් තුළ ඇතුළත් රු. 1,437,882 ක අධ්‍යයන දීමනා අදාළ ආයතනය වෙතින් ප්‍රතිපූරණය කළ නොහැකි බව දන්වා තිබූ බැවින්, එම මුදල් අදාළ කථිකාචාර්යවරියගෙන් අය කළ යුතු වුවත්, ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂයේද කටයුතු කර නොතිබුණි.

(ඊ) රසායන විද්‍යාගාර ගොඩනැගිල්ල හා නව කලාගාරය අළුත්වැඩියා කිරීමේ කාර්ය කොන්ත්‍රාත්කරු අත්හැර ගොස් තිබුණු බැවින් 2012 අප්‍රේල් 25 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු. 2,268,483 ක අත්තිකාරම් මුදලින් ආවරණය නොකළ වැඩ වෙනුවෙන් අයවිය යුතු රු. 1,764,013 ක් කාර්යසාධන බැඳුම්කරයෙන් අයකරගෙන නොතිබුණු අතර එම මුදල කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

(උ) වෙනත් විශ්වවිද්‍යාලවලින් සප්ත වාර්ෂික නිවාඩු ලබා පැමිණෙන නිලධාරීන් සේවයේ යොදවා ගැනීමේදී ඔවුන්ගේ පාරිශ්‍රමිකවලින් උපයන විට ගෙවීම් බදු අඩුකිරීම සඳහා නියමිත බදු වක්‍රය උපයෝගී කර නොගැනීම හේතුවෙන් නිලධාරීන් 3 දෙනෙකුගේ පාරිශ්‍රමිකවලින් රු. 318,850 ක් අඩුවෙන් බදු අයකර ගෙන තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

--------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන නොකිරීම |
| (ආ) | මෙහෙයුම් පාලනය | (i) නිසි ප්‍රමිතියකින් යුක්ත ස්වයංක්‍රීය පරිගණක පද්ධතියක අවශ්‍යතාව අවධාරණය නොකිරීම.<br>(ii) අයකර ගත යුතු ගාස්තු අප්‍රමාදව අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවා ගැනීම් විධිමත්ව සිදු නොකිරීම. |
| (ඈ) | ස්වයං මූල්‍ය පාඨමාලා කළමනාකරණය | අතිරික්ත මුදල් නිසි ලෙස පරිහරණය නොකිරීම සහ ගිණුම්කරණ අඩුපාඩු පැවතීම. |
| (ඉ) | පර්යේෂණාධාර පිළිබඳ අභ්‍යන්තර පාලනය | පර්යේෂණාධාර උපයෝජනය පිළිබඳ පසුවිපරම් නොකිරීම හා ප්‍රගතිය පරීක්ෂා නොකිරීම. |
| (ඊ) | මූල්‍ය පාලනය | (i) මුදල් ලැබීම්වලට අදාල කාල නිර්ණය නිවැරදිව හඳුනා නොගැනීම.<br>(ii) මුදල් පොතේ හිඟ ශේෂ පැවතීම. |
| (උ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රසම්පාදන සිදුනොකිරීම සහ ගිවිසුම්වලට එළඹීමේ අඩුපාඩු පැවතීම. |